# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1458 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/09/2024<br>පැය 0930 |

# මාධ්‍ය නිවේදනය

**තීරුබදු නොගෙවා මෙරටට රැගෙන එන ලද විදේශීය මත්පැන් ඇතුළු භාණ්ඩ තොගයක් අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගුවන්තොටුපල ඒකකය.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කටුනායක ඒකකයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරකට අනුව කටුනායක ගුවන්තොටුපලේ ගුවන් මගීන් පැමිණීමේ පර්යන්තයේදී තීරුබදු නොගෙවා මෙරටට රැගෙන එන ලද විවිධ වර්ගයේ විදේශීය මත්පැන් බෝතල් 159 ක්, විදේශීය සිගරට් පැකට් 175 ක්, නිම් ඇඳුම් හා රත්‍රං නොවන පළඳනා තොගයක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් සැකකරුවන් පස් දෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24, 41, 52, 53, 70 යන වයස්වල පසුවන වත්තල, කොටගල හා කොළඹ 13 ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර එක් සැකකරුවෙකු ඉන්දීය ජාතිකයෙකි. සැකකාරිය වයස අවුරුදු 48 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගුවන්තොටුපල ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මෙයට අදාල ඡායාරූප කිහිපයක්







**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**